**ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 19 දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

--------

## 2.1 විසර්ජන ගිණුම

------------------

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 406.22 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 396.44 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 9.78 ක් හෙවත් සියයට 2 .41 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 352.92 | 344.12 | 8.80 | 2.49 |
| මූලධන | 53.30 | 52.32 | 0.98 | 1.84 |
| **එකතුව** | **406.22** | **396.44** | **9.78** | **2.41** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යන් සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 26ක් හා දෙපාර්තමේන්තු 15 ක් විසින් එකතුව රු.මිලියන 961.25 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු. මිලියන 876.49 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබු ප්‍රතිපාදනවලින් රු. මිලියන 84.76 ක් හෙවත් සියයට 8.82 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2. අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27101 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25.88 | 23.29 | 17.87 | 19.69 | 100.00 | 74.58 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0289/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 20.71 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 79.22 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0104/000 | 2.04 |
| 6000/0000/00/0013/0070/000 | 4.43 |
| 6000/0000/00/0014/0011//000 | 5.59 |
| 6000/0000/00/0016/0052/000 | 67.16 |
| එකතුව | 79.22 |

## 2.5 විගණන නිරීක්ෂණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදය දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (iii) | හානි පිළිබද ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iv) | බැරකම් පිළිබඳ ලේඛනය. | මුදල් රෙගුලාසි 214 |

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 47 ක්දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

#### 3.2.2 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරිම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පලතුරු ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැය විෂයයක් යටතේ රු.මිලියන 0.1 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, 2015 දෙසැම්බර් 31 වන විටද එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ආ) ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු පෙර පාසල් දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණි. ඒ යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11ක් තුළ රු.7,338,803 වියදම් කර තිබුණි. නමුත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වැඩිම ජනගහනයක් වාසය කරන නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පෙර පාසල් සහ මුල් ළමාවිය සංවර්ධන

මධ්‍යස්ථාන 96 ක් ක්‍රියාත්මක වී තිබුණු අතර ඉන් 13 ක පමණක් කිරි වීදුරුව සැපයීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.914,760 ක ප්‍රතිපාදනය සලසා තිබුණත්, ඉන් රු.640,380 ක් හෙවත් සියයට 70 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම්

--------------

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් 31 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ශේෂය රු 20,706,344 ක් වී තිබුණි. ඉන් එකතුව රු75,000ක් වූ ශේෂයක් මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව 2011 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

### 3.4 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු 7,755,472 ක් වූ තැන්පතු 120 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) කන්තලේ ශ්‍රී ගංගාරාම විහාරස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2011 වර්ෂයේදී රු.250,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන 2015 දෙසැම්බර් 31 දින වන විටද අදාළ කාර්ය ඉටු නොකර එම මුදල් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් ජල කුළුණක් ඉදිකිරීම සඳහා ඉඩමක් පවරා ගැනීම වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා කන්තලේ ප්‍රාදේශීය ලේකම් වෙත රු.150,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. ඉන් රු.73,185 ක් 2011 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින වන විටද උපයොජනය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) සවුදි අරාබියේදී අවාසනාවන්ත ලෙස ජීවිතය අහිමි වූ රිසානා නාෆික් මෙනවියගේ පවුලට නව නිවසක් ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු. 250,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම මුළු ප්‍රතිපාදනයම 2013 ජනවාරි 23 දින සිට අදාළ කාර්යය සඳහා යොදා නොගෙන 2015 දෙසැම්බර් 31 දින වන විටද තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සංසමිත්තා විශ්‍රාම ශාලාව අලුත්වැඩියා කිරීම සඳහා 2014 ඔක්තෝබර් 21 දින රු.406,686 කට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුකට එළඹ තිබුණි. ඒ අනුව 2015 මාර්තු මාසය වන විට එම මුළු මුදලම වැය කර තිබුණි. සංසමිත්තා විශ්‍රාම ශාලාවෙන් ලැබෙන ආදායම් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගන්නා අතර ඉහත වියදම වෙනුවෙන් 2015 ජුලි 29 වන දින මාරු පත්‍රයක් මගින් වැය විෂයට මාරුකර තිබුණි.

### 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

--------------------------------------------------------------------------

විෂය අංක 27101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,128,089 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 3.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2.1 (අ) , (ආ) හා (ඇ) මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් අවුරුදු 03 ක් සඳහා පිළියෙල කළ යුතු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණත්, එළඹෙන වර්ෂයන් සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් 2016 ජුනි 30 දින වන විට පිළියෙල කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.2.1(ඉ) මාර්ගෝපදේශය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.

### 3.6.2 වත්කම් කළමනාකරණය

-----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජන වත්කම්

-----------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිශ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවතී බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පවතී කාලය |
|---|---|---|
| **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** | | |
| මෝටර් වාහන | 06 | වර්ෂ 01 ක සිට |
| **පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | |
| ජල පෙරනය | 01 | වර්ෂ 01 ක සිට වර්ෂ 06ක් දක්වා |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

------------------------------------------

පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල, නගර හා කඩවත් සහ මොරවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි 2015 වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

යලි පුබුදමු ශ්‍රී ලංකා ව්‍යාපෘතියෙහි, ව්‍යාපෘති ගණකාධිකාරී විසින් 2015 ජූනි 05 දින නිකුත් කළ, නිකුත් කිරීමේ නියෝග අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට භාරදෙන ලද වාහනය දිස්ත්‍රික් ලේකම් තුමාගේ නමට 2016 පෙබරවාරි 25 දින වන විටත් පවරාගෙන නොතිබුණි.

## 3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 3.7.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කප්පල්තුරේ ප්රදේශයේ අලිවැට සකස් කිරීම ආරම්භ කර තිබුණත් 2014 අගෝස්තු මාසයේදී රු.1,148,993 ක් වැය කළ පසුව එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

## 3.8 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගමනැගුම සංවර්ධන වැඩසටහන යටතේ මහදිවුල්වැව II අදියර සඳහා මාතෘ සායන මධ්‍යස්ථානයක් ඉදිකිරිම සඳහා රු.1,960,468 ක් වැය කර තිබුණද, එම මාතෘසායන මධ්‍යස්ථානයට සවිකර තිබූ ජනේල සහ දොරවල් සඳහා I පළමු පන්තියේ දැව භාවිතා කර නොතිබුණි. මෙම මාතෘ සායන මධ්‍යස්ථානය ඉදිකිරීම් 2015 දෙසැම්බර් 31 දින නිමකර තිබුණද, ජල සැපයුම සහ විදුලි සැපයුම ලබා දී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයාට භාරදීමට කටයුතු කර නොතිබුණු බැවින් මාතෘ සායන මධ්‍යස්ථාන ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශය තුළ 2015 දෙසැම්බර් 31 දින වන විට වකුගඩු අසාදිත රෝගීන් 258 දෙනෙකු වාර්තා වී තිබුණි. ඊට අදාළ පිළියම් ලෙස ජල පෙරන යන්ත්‍ර මගින් ජලය ලබා දීමේ අරමුණින් ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2010 වර්ෂය තුළ පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලීටර් 500 ක ජල පෙරන යන්ත්‍රයක් ලබා දී තිබුණි. එය 2016 ජූනි මාසයේ විගණන දින වන විටත් භාවිතයට නොගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාවේ පැවැතුණි. ඒ අනුව වකුගඩු රෝගීන් වෙනුවෙන් ලබා දී තිබුණු ජල පෙරන යන්ත්‍රය භාවිතයට නොගැනීම හේතුවෙන් අදාළ අරමුණු ඉටු වී නොතිබුණි.

## 3.9 පාඩු හා හානි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක 2002 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ වාහන 09 ක් අනතුරට ලක්වීමෙන් රු.3,587,096 ක අලාභහානි සිදු වි තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව පරීක්ෂණ 2016 ජූනි 30 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**3.10 විසඳා නොතිබුණු විගණන ඡේද**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු විගණන ඡේදවලට යොමුව පහත දක්වා ඇත.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 3.7(අ) | 2011 ඔක්තෝබර් මාසය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පවත්වා ගෙන ගිය ත්‍රිකුණාමලය පේදුරු කොටුවේ අක්කර 372 ක භූමිය හා එහි පිහිටි ගොඩනැගිලි හා නිවාස ඇතුළත්ව පුරා විද්‍යා භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණි. එහි අයිතිය පවරා දෙන ලෙස පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2011 ජනවාරි 04 දිනැති අංක M/EP/1/7A දරන ලිපියෙන් දැනුම් දී තිබුණත්, 2016 ජුනි 30 දින වන විටත් නිත්‍යානුකූලව පවරා දී නොතිබුණි. |
| 2014 | 3.15 (අ) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටි ඉඩම රාජ්‍ය දැව සංස්ථාවට අයත්ව පවතින නමුත් එහි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2014 | 3.11(ඇ) | විල්ගම කැලය මැද පරිසර උද්‍යානයක් වටා අලිවැට සකස් කිරීමට සපයා තිබූ උපකරණ අනාරක්ෂිතව නිෂ්කාර්යව පැවැතුණි. වර්තමානය වන විට අදාළ පරිසර උද්‍යානයේ ඉදිකිරීම් නතර කර තිබුණි |

**3.11 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් 31 දිනට ලියන ලද රු. 16,381,816 ක චෙක්පත් 05 ක් 2016 පෙබරවාරි 15 දින වන විටත් ආදායකයින් වෙත නිකුත් නොකොට රඳවා තිබුණි.

(ආ) මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක ග්‍රාමීය සංවර්ධන සමිති 07 ක් සඳහා රු.7,265,000 ක ජීවනෝපාය සංවර්ධන ණය විවිධ ව්‍යාපෘති මගින් ලබා දී තිබුණි. ව්‍යාපෘති අවසානයේ එම ණය පරිපාලන කටයුතු මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරියාට පවරා තිබුණද, එම නිලධාරියා විසින් ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) මුතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පුනුරුත්තාපන හා නැවත පදිංචිකිරීම් අමාත්‍යාංශය මගින් ග්‍රාමීය ජනතාවට වැසිකිළි පහසුකම් ලබා දීම සඳහා ප්‍රතිපාදන ලබා දී තිබුණි. ඒ සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනිම ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව වැඩි ලකුණු ලබා ගත් ප්‍රතිලාභීන් 09 දෙනෙකු පැහැදිලි හේතු රහිතව තෝරාගෙන නොතිබුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**--------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 35 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 36 | 14 | 22 |
| (iii) | ද්විතියික මට්ටම | 804 | 474 | 330 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 145 | 120 | 25 |
| | **එකතුව** | **1025** | **643** | **382** |